**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - 2021**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු.194,197,449 ක් වූ පුස්තකාල පොත් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද ප්‍රමිතයේ 92 ඡේදය ප්‍රකාරව මෙවැනි වත්කම් පිළිබඳව හෙළිදරව් කිරීම් සිදුකරද නොතිබුණි. | පොත්වල වටිනාකම් ගණනය කිරීමේ කටයුතු මේ වන විටත් සිදුකරමින් පවතින අතර මෙම වර්ෂයේදී එම කටයුතු අවසන්කර 2022 මූල්‍ය ප්‍රකාශන මඟින් එය හෙළිදරව් කිරීමට බලාපොරොත්තු වන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවල ට අනුකූලව ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන මෙවලම් (course materials) ඉතිරි තොගයේ පිරිවැය රු.1,480,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | එය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂය අවසාන භෞතික ඉතිරි තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2020 මාර්තු මාසයේදී ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබී තිබුණු මෝටර් රථ 02 හි රු.6,500,000 ක් වූ තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු වටිනාකම් වත්කම් ලැබෙන අවස්ථාවේදී ගණනය කර නොතිබීම හේතුවෙන් එම වාහන 2020 මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට නොහැකි විය. නමුත් මේ වනවිට එම වත්කම් තක්සේරු කර ඇති බැවින් 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එය නිවැරදිව හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | පරිත්‍යාග වශයෙන් ලැබෙන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ස්ථාවර තැන්පතු 07 කට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු.1,322,959 ක පොලී ආදායම ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ඊට සමාන අගයකින් වර්ෂයේ අතිරික්තය හා ලැබිය යුතු පොලී ආදායම අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2022 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොලිය නිවැරදිව ගණනය කර, ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු ශිෂ්‍ය ආදායම නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව ශිෂ්‍ය පාලන ගිණුමේ ශේෂය හා හඳුනානොගත් ශිෂ්‍ය ආදායම් ගිණුමේ ශේෂය අතර රු.442,108,770 ක වෙනස ලැබිය යුතු ශිෂ්‍ය ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේම එම ලැබිය යුතු ශිෂ්‍ය ආදායමට හා හඳුනානොගත් ශිෂ්‍ය ආදායමට අදාළ කාල විශ්ලේෂණ විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | OMIS පරිගණක පද්ධතියේ පවත්නා අඩුපාඩු හේතුවෙන් ශිෂ්‍ය ආදායමට අදාලව නිවැරදි කාල විශ්ලේෂණයක් ලබා ගැනීමට නොහැකි වී ඇත. නව පරිගණක පද්ධතිය මඟින් එම අඩුපාඩු නිවැරදි කර ගැනීමට ඉදිරියේදී බලාපොරොත්තු වේ. | ලැබිය යුතු ශිෂ්‍ය ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හා ඊට අදාල කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ගෙවීම් වවුචර, ලදුපත් හා ජර්නල් වවුචරය වැනි මූලාශ්‍ර | OMIS පරිගණක පද්ධතිය මඟින් ක්ෂය ගණනය කිරීම් නිවැරදිව සිදු | පරිගණක මෘදුකාංගයේ පවතින අඩුපාඩු නිවැරදි |

| | | | |
|---|---|---|---|
| | ලේඛන පිළියෙල කිරීමකින් තොරව, ක්ෂය, ක්ෂය වෙන්කිරීම් හා වත්කම් ගිණුම්වලට පරිගණක ගිණුම් පද්ධතිය තුළින් සටහන් යෙදීම සිදුවී තිබුණි. එවැනි සටහන් තුළ වූ වැරදි සටහන් නිවැරදි කිරීම සඳහා වර්ෂය අවසානයේදී ජර්නල් සටහන් යොදා ක්ෂය හා ක්ෂය වෙන් කිරීමේ ගිණුම්වලින් රු.335,896,468 ක් ඉවත් කර තිබුණි. එසේම වැඩියෙන් අයකර තිබුණු රඳවුම් මුදල් රු.1,198,818 ක් නිවැරදි කිරීමේ ගැලපීම් සටහන සඳහා ජ'ර්නල් සටහනක් යොදා නොතිබුණි. | නොවේ. ඒ අනුව පරිගණක පද්ධතිය මඟින් ලබා දෙන ක්ෂය ගණනය කිරීම් ජර්නල් සටහන් මඟින් ඉවත්කර, නිවැරදිව ගණනය කරන ලද වාර්ෂික ක්ෂය අගය ජර්නල් සටහන් මඟින් පරිගණක පද්ධිතයට ඇතුලක් කිරීම සිදුකරයි. | කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.4,847,854 ක් වූ අස්පෘශ්‍ය වත්කම් ඒවා මිලදී ගත් දිනයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ක්‍රමක්ෂය කර නොතිබුණි. | රු.5,340,344.00 ක් වූ E-books හා මෘදුකාංග (Software) හි ජීවිත කාලය පුරෝකථනය කල නොහැකි බැවින් එම වත්කම් අවිනිශ්චිත ජීවිත කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කම් ලෙස හෙලිදරව් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව SLPSAS 20 ට අනුව එම වත්කම් ක්‍රමක්ෂය නොකරන ලදී. | අස්පෘශ්‍ය වත්කම්වල ජීව කාලය හඳුනාගෙන ක්‍රමක්ෂය කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ පිරිවැය රු.186,010,726 ක් වූ මහල් හතකින් යුත් ගොඩනැගිල්ලේ වැඩ 2021 මාර්තු 15 දින නිමකර තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින ප්‍රාග්ධනිත ගත කිරීම හේතුවෙන් එම කාලපරිච්ඡේදයට අදාළව රු.6,599,559 ක් වූ ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් භාවිතයට ගතහැකි තත්ත්වයට පත් කළ දින සිට ක්ෂය ගණනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 102, 103, 104, හා 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාල පාලක මණ්ඩලයේ අනුමැතිය මත 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා එකතුව රු.25,046,765 ක හානි වූ අධ්‍යයන ප්‍රකාශන (Course materials) පොත්වලින් කපාහැර තිබුණි. එසේම මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | (i) අධ්‍යයන වර්ෂ අතර තුර සිසුන් විසින් පාඨමාලා හැර යාම, විෂය නිර්දේශයන් වෙනස්වීම් ආදී කරුණු හේතුවෙන් ඇතැම් විට මුද්‍රණය කරන ලද පොත්පත් ඉවත් කිරීමට සිදුවේ. මෙය මාර්ගගත අධ්‍යාපනික ලබා දෙන විශවවිද්‍යාලයක් තුල සිදුවිය හැකි පොදු තත්වයකි. ඒ අනුව මුද්‍රණය කරන ලද පොත් පත් භාවිතයෙන් ඉවත් කිරීම තොග හානියක් ලෙස සඳහන් කල නොහැකිය. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. තවද, පවත්වාගත යුතු තොග මට්ටම් තීරණය කර ඒ අනුව ඇණවුම් ලබාදීමට කටයුතු කර, රජයට සිදුවන පාඩුව අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii) 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව පැවති වෙනස්කම් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් කිරීම සඳහා උපකුලපතිතුමා විසින් 2020 අගෝස්තු 06 දින මූලික විමර්ශන මණ්ඩල දෙකක් පත්කර තිබුණු නමුත් 2022 මැයි 31 දින වන විටත් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණි. | (ii) භාෂා අධ්‍යන අංශයට හා විභාග අංශයට අදාලවූ මූලික විමර්ශන වාර්තා වල ඇති නිර්දේශ ප්‍රකාරව කටයුතු කිරීම දැනටමත් සිදු කෙරෙමින් පවතී. තවද තොරතුරු තාක්ෂණ අංශට අදාළ වූ මූලික විමර්ශන වාර්තාවේ යම් යම් අඩුපාඩු ඇති අතර එය වැඩිදුරටත් පැහැදිලි කරගැනීම සඳහා විමර්ශන මණ්ඩල සභාපතිතුමා හට ඉල්ලීමක් කර ඇත. එය ලැබුණු විගස එයට අදාළ කටයුතු සිදු කිරීමට කටයුතු යොදා ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල්රෙගුලාසි 113(3) (ආ) | සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචිය අළුත් නොකරන වර්ෂ 05 ඉක්ම වූ ශිෂ්‍යයන්ගෙන් ලැබිය යුතු රු.43,729,298 ක් වූ ශිෂ්‍ය ආදායම් භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමකින් තොරව කපා හැර තිබුණි. | 2021 වර්ෂයට අදාලව පාලක සභා අනුමැතිය මත පාඨමාලා හැරගිය සිසුන්ගේ අයවිය යුතු රු.48,729,298.00 ක මුදලක් කපා හැරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | මුදල්රෙගුලාසි 1645 (ආ), (ඇ) හා මුදල්රෙගුලාසි 1646 | විශ්වවිද්‍යාලයේ වාහන 12 කට අදාළව 2021 ජනවාරි සිට 2022 පෙබරවාරි දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ඉන්ධන තුලනය කළ යුතු අනුපාතය අනුව ඉන්ධන ලීටර් 2,728 ක් වැඩිපුර යොදවා තිබුණි. එසේම වාහන 05 කට අදාළව ධාවනය කරන ලද කිලෝමීටර් ගණන දෛනික ධාවන සටහන්වල සඳහන් කිරීමකින් තොරව රු.232,687 ක් වූ ඩීසල් ලීටර් 1,850 ක් හා පෙට්‍රල් ලීටර් 127 ක් යොදා තිබුණි. | පිළිගනිමි. අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) | මුදල්රෙගුලාසි 1647 (ආ) | විශ්වවිද්‍යාලය සතු පිරිවැය රු.110,736,110 ක් වූ වාහන හා උපකරණ පිළිබඳ වාර්ෂික සමීක්ෂණ පවත්වා නොතිබුණි. | පිළිගනිමි. එසේ වුව ද මේ ඉදිරියේ දී භාණ්ඩ තොග සමීක්ෂණ මණ්ඩලයක් පත්කර වාහන හා වාහන සතු උපකරණ තොග සමීක්ෂණය සඳහා කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7.6 වගන්තිය | 1989 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලසීමාව තුළ බැඳුම්කර ගිවිසුම් කඩකරන ලද නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු එකතුව රු.19,884,652 ක් ගිවිසුම් කඩකළ දින සිට හා නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.9,817,731 ක් 2017 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2021 | මෙම නිලධාරීන් අතරින් බැඳුම්කර කඩකර වසර දහය ඉක්මවූ නිලධාරීන්ගේ අර්ථසාධක අරමුදල් ශේෂයෙන්, ඔවුන්ගේ කැමැත්ත හා ප්‍රකාශ කරන ලිපිය රහිතව අයකරගැනීමට අනුමැතිය ලබාගැනීමට ලිපියක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇත.<br>දෙදෙනෙකුගෙන් අයවිය යුතු මුදල අර්ථසාධක අරමුදලින් අයකිරීමටත්, | බැඳුම්කර හා ගිවිසුම් කඩකිරීම හේතුවෙන් රජයට අයවිය යුතු මුදල් කඩිනමින් අයකර විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | දෙදෙනෙකුට නඩු පැවරීමටත් කටයුතු කර ඇත.එසේම කල්ගත වී ඇති බැඳුම්කර කඩකිරීම් පිළිබඳ සොයාබැලීමට කමිටුවක් පත් කිරීමට කටයුතු කර ඇත. | |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.14,266,095,834 ක් වූ දේපළ, පිරියත හා උපකරණ සහ පිරිවැය රු.16,167,163 ක් වූ අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | විගණනය විසින් ඉල්ලා ඇති ස්ථාවර වත්කම් ලේඛන මූල්‍ය ප්‍රකාශන ගිණුම් වලට අදාල උපලේඛන වල දක්වා ඇත. | භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් කඩත්තු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 348 දෙනෙකුගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.1,317,557,428 ක් ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහයේ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයේ ප්‍රතිපාදන සලසා තිබුනද අධ්‍යයන කාර්යය මණ්ඩලය පැමිණීම පිටවීම සටහන් කරනු නොලැබේ. | ආයතන සංග්‍රහය හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2015 ජූලි 14 දිනැති අංක 04/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය සහ 2019 අගෝස්තු 15 දිනැති අංක 06/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව තරඟකාරී ලෙස මිලගණන් කැඳවා වාහන සඳහා රක්ෂණ ආවරණ සලසා ගැනීමට වාර්ෂිකව කටයුතු නොකර , මිලගණන් කැඳවීමකින් තොරව 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා එකතුව රු.8,149,311 ක් ගෙවීම් කර අඛණ්ඩව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් රක්ෂණාවරණ සලසා ගැනීමට කටයුතු කර තිබුණි . තවද 2018 | රාජ්‍ය මුදල් චක්‍රලේඛය 06/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ක්‍රියාත්මක වූයේ 2019/08/19 දින සිට බැවින් එහි සඳහන් ප්‍රතිපාදන ප්‍රකාරව රක්ෂණ සේවා ලබා ගැනීමේදී ලියාපදිංචි රක්ෂණ සේවා ආයතන වෙතින් මිල ගණන් කැඳවීමක් සිදු කර අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය සහිතව පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම වෙත රක්ෂණ සේවා සැපයීම කොන්ත්‍රාත්තුව භාර දෙන | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වර්ෂයේ සිට අනතුරකට ලක්ව තිබුණු වාහන 5කට අදාළව අළුත්වැඩියා කටයුතු සිදුකර රක්ෂණ වන්දි ලබාගැනීමට 2022 පෙබරවාරි 21 දින වන විටත් කටයුතු කර නොතිබුණු බව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවකදී අනාවරණය විය. | ලදී. මෙහිදී විශ්වවිද්‍යාලය චක්‍රලේඛයන්ට අනුකූලව කටයුතු කර ඇත. | |
| (ඊ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරකම් සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | විශ්වවිද්‍යාලය විසින් සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන කරන ලද සැලැසුම්වල පිටපත් මහා භාණ්ඩාගාරයට සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අදාල අංශයට යවනු ලැබේ. | ඉදිරි වර්ෂය තුළදී ඉටුකරගැනීමට අපේක්ෂිත,කාර්යය භාරයට අදාළව ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan) පිළියෙල කළ යුතුය |
| (උ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව 2020 දෙසැම්බර් 31 දින වන විට රු.251,886,511 ක් හා සමාලෝචිත වර්ෂය තුළදී රු.261,383,503 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | භාණ්ඩාගාර අනුමැතිය ලැබෙන තුරු කෙටිකාලීන ආයෝජන කිරීම් ප්‍රමාද කල නොහැකි බැවින් භාණ්ඩාගාර නිලධාරීන්ගේ උපදෙස් මත ස්ථාවර තැන්පතු වල අයෝජනය කරන අවස්ථාවේදීම භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලීම් ලිපි භාණ්ඩාගාරයට යොමුකර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.103,989,560 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.531,516,776 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 635,506,336 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන ශිෂ්‍ය ආදායම් හා කෙටිකාලීන පාඨමාලා ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලයේ අංශ 05 ක කටයුතු සම්බන්ධයෙන් මොඩියුල 05 ක් ලෙස ස්ථාපිත කර තිබුණු මෙහෙයුම් කළමනාකරණ තොරතුරු පද්ධතියේ (OMIS) පවතින අඩුපාඩු අදාළ නඩත්තු සමාගම් වෙතින් නිරාකරණය කරවා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොහැකිවී තිබුණි. එම නිසා පවතින තොරතුරු පද්ධතියට වඩා කාර්යක්ෂම සහ විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙස තොරතුරු තාක්ෂණ අංශය මඟින් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කරවා ගැනීමට විශ්වවිද්‍යාලය අවධානය යොමු කර ඇති බව විගණනය වෙත දන්වා තිබුණු නමුත් එම නව තොරතුරු පද්ධතියද 2021 වර්ෂය අවසාන වන විටත් ස්ථාපිත කර නොතිබුණි. | තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම ඉතා කෙටි කාලයකින්, පහසුවෙන් සිදුකල නොහැකිය. නව තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම් කටයුතු විශ්වවිද්‍යාලය ආරම්භකර ඇති අතර එම කටයුතු මේ වන විටත් අඛණ්ඩව සිදුකරමින් පවතියි. | දැනට පවතින පද්ධතියේ අඩුපාඩු නැවත ඇති නොවන ලෙස නව පරිගණක පද්ධතිය හඳුන්වා දීමට නොපමාව කටයුතු කළ යුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත පමණක් කොන්ත්‍රාත් පදනම මත අධ්‍යයන නිලධාරීන් 39 දෙනෙකු හා අනධ්‍යයන නිලධාරීන් 179 දෙනෙකු බඳවා ගෙන 2021 වර්ෂය සඳහා පමණක් රු.100,614,207ක් දීමනා ලෙස ගෙවා තිබුණි. | 2020, 2021 වර්ෂ දෙකෙහිම විශ්‍රාම ගැනීම, සේවයෙන් ඉල්ලා අස්වීම, මිය යාම සහ වෙනත් විශ්වවිද්‍යාලවලට ස්ථාන මාරුවීම් නිසා පුරප්පාඩු රාශියක් ඇතිවිය. ඒ හේතුවෙන් පාලක සභා අනුමැතිය ලබා ගෙන අධ්‍යයන කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා කොන්ත්‍රාත් හා තාවකාලික පදනම මත අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනුණි. | භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂ එකේ සිට වර්ෂ 05 ක කාලයක සිට මෝටර් රථ 03 ක් උපයෝජනය කිරීමකින් තොරව විශ්වවිද්‍යාල පරිශ්‍රයේ රථගාලේ හා ඉන් පිටත අනාරක්ෂිතව නවතා තිබුණි. එම කාලපරිච්ඡේදය සඳහා වාහන පූර්ණ රක්ෂණාවරණයට රු.235,269 ක මුදලක් අනාර්ථිකව වැයකර තිබුණි. | මෙම වාහන අලුත්වැඩියා කිරීම සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් 10 දෙනෙකු වෙතින් 2021.12.29 දින මිළ ගණන් කැඳවූ අතර නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව කටයුතු කර තිබුණි. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය සහ සුළු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය පරිදි වාහන දෙකක අලුත්වැඩියාවන් සඳහා යොමු කර ඇත. වැන් රථයේ අලුත්වැඩියා සඳහා ප්‍රධාන ගණන් දීමේ නිළධාරීගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.<br>රක්ෂණාවරණය සමූහ රක්ෂණයක් (Insurance for Fleet of Vehicles) බැවින් සහ මෙම වාහන අලුත්වැඩියා කර ධාවනය කිරීමට හැකිවන පරිදි මෙම වාහනද ඇතුළුව වාහන 34 ක් සඳහා රක්ෂණාවරණය ලබාගෙන ඇත. | ධාවනය කරනු ලබන වාහන සඳහා පමණක් රක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. එසේම අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට ඇති වාහන ප්‍රමාදයකින් තොරව අලුත්වැඩියා කටයුතු සිදුතර ධාවනයට සුදුසු තත්ත්වයට පත් කළ යුතුය. |